# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2193/50 - 2020 සැප්තැම්බර් මස 18 වැනි සිකුරාදා - 2020.09.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය :* මීරි/ප්‍රා.ලේ/ඉ/5/42/2013.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය :* 4-3/4/2013/D/345.

ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව වෙත ඉඩම් අත්කර ගැනීම යුධ හමුදා කඳවුර - අබේපුස්ස පුස්තකාලය සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යතාව ලබා ගැනීමට අදහස් කරන බැවි, 1950 අංක 09 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ / පරවශ්‍යතාවේ විස්තර :-*

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩුගහපත්තුවේ කීනදෙණිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ තෙන්නගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවට ගම්පහ දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් 2017.06.27 දිනැතිව පිළියෙළ කර ඇති මූලික පිඹුරු අංක ගම් 3967 කැබලි අංක 01 හා කැබලි අංක 02 දක්වා පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.5063ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි (02) :

1. **කැබලි අංක 01 - පිඹුරු අංකය 3967**

ඉඩමේ නම: කීනදෙනිකන්ද; ඉඩමේ විස්තරය: ගෙවත්ත අවු. 50ක් පමණ වයසැති පොල් ගස් 17ක්ද, අවු. 15ක් පමණ වයසැති මහෝගනී ගස් 8ක්ද, අවු. 12ක් පමණ වයසැති කොස් 05ක් සහ අවු. 10ක් පමණ වයසැති හල්මිල්ල ගස් 2ක් ඇත. අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා; මුල් හිමිකම් කියන අය: ඊ. ඒ. ලයනල්; ප්‍රමාණය: හෙක්ටයාර් 0.4224

2. **කැබලි අංක 02 - පිඹුරු අංකය 3967**

ඉඩමේ නම: කීනදෙනිකන්ද; ඉඩමේ විස්තරය: වත්ත (කැ.මැ.මු.පි. 75 කැබලි අංක 18හි කොටසකි) ප්‍රවේශ මාර්ගය සඳහා වෙන් කරන ලද බිම අබේපුස්ස ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේ ඉදිකිරීම සඳහා අවශ්‍යව ඇත; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0839

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලිඛිත බලයලත් අය හෝ 2020 ඔක්තෝබර් මස 23 වැනි දින පෙ.ව. 09.00ට මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ඉදිරිපත් විය යුතු යි.

තව ද 2020, නොවැම්බර් මස 04 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණනය කළ ආකාරය මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඩබ්. පී. ප්‍රසාද් ඉන්දික,
ප්‍රාදේශීය ලේකම් / අත්කර ගැනීමේ නිලධාරි,
මීරිගම.

2020 සැප්තැම්බර් මස 11 වැනි දින,
මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 - 133

1A - G 32918 – 30 (2020/09)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : KOT/LND/ACQVI/01/81.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/3/2019/FR/202.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :-

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 241H කන්දිල්පාන ග්‍රාම නිලධාරි වසමේ කිරිවැල්දොල ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද අවසාන ගම් පිඹුරු අංක 125හි පත්‍ර 12හි අතිරේක 12හි කැබලි අංක 86 ප්‍රමාණයෙන් හෙක්ටයාර් 11.4960ක් වූ මාණික්කවත්ත නමැති ඉඩම් කැබැල්ලට මායිම්:

කැබලි අංක 86 - ඉඩමේ නම: මාණික්කවත්ත; ඉඩම් හිමියාගේ නම: ඒ. ඩී. දළුවත්ත ටී එස්ටේට් (පුද්) සමාගම; ප්‍රමාණය: හෙක්. 11.4960

*උතුරට* : සබරගමුව පළාත සහ කැබලි අංක 48; *නැගෙනහිරට* : කැබලි අංක 1 සහ 48; *දකුණට* : කැ.මැ.මු.පි. 23හි කැබලි අංක 73; *බටහිරට* : සබරගමුව පළාත සහ කැබලි අංක 48.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2020 ඔක්තෝබර් මස 12 වැනි දින ප.ව. 02.30ට කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද 2020, ඔක්තෝබර් මස 05 වැනි දිනට මත්තෙන් ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ගනේෂ අමරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
කොටපොල.

2020 සැප්තැම්බර් මස 14 වැනි දින,
කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 - 134

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.